Department of Education, Sabaragamuwa Province/ Weekly School

## පුනරීක්ෂණ අභ්‍යාස

1. යොවුන් වියේදී ලිංගික හෝමෝන වල බලපෑම මත ගැහැණු හා පිරිමි දෙපිරිස තුළම හෙළි වන ද්විතියික ලිංගික ලක්ෂණ ලියා දක්වන්න.
2. සංසේචනය හඳුන්වන්න.
3. කෙටි සටහන් ලියන්න.

    1. අධි රෝපණය        2. ආර්තවය

4. සක්‍රීය ඩිම්බයක ආයු කාලය කුමන කාල පරාසයක්ද?
5. කාන්තාවකගේ සරු කාලය ලෙස හැඳින්වෙන්නේ කුමන කාල සීමාවක්ද?
6. ස්ත්‍රී හා පුරුෂ ප්‍රජනක හෝමෝන නම් කරන්න.
7. ලිංගික සම්ප්‍රේෂණ ආසාදනයක් යනු කුමක්ද?
8. සමාජය තුළ බහුලව පවතින ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග 4ක් නම් කරන්න.
9. ලිංගික සම්ප්‍රේෂණ ආසාදන වල ලක්ෂණ 4ක් නම් කරන්න.
10. HIV හා ඒඩ්ස් හඳුන්වන්න.
11. "නවජ දරුවා" යන්න හඳුන්වා ගති ලක්ෂණ 4ක් නම් කරන්න.
12. නවජ දරුවාගේ ප්‍රතීක ක්‍රියා හඳුන්වන්න.
13. නවජ දරුවාගේ ප්‍රතීක ක්‍රියා 4ක් නම් කරන්න.
14. දරුවකුගේ සංවර්ධනය සිදුවන ආකාර 2 නම් කරන්න.
15. දරුවෙකුගේ උපතේ සිට මාස 12 දක්වා පෙන්වන හැකියාවන් නම් කරන්න.
16. මව් කිරි නිපදවීමට වැදගත් වන හෝමෝනය නම් කරන්න.
17. මව් කිරි දීමෙන් දරුවාට සැලසෙන වාසි 4ක් ලියන්න.
18. මව් කිරි දීමෙන් මවට සැලසෙන වාසි 3ක් නම් කරන්න.
19. ළදරුවෙකු අතිරේක ආහාරවලට හුරු කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න.
20. දරුවාට ලබා දිය හැකි අතිරේක ආහාර වර්ග 4ක් නම් කරන්න.